# ඡායා රූ පිළිසඳර

2009 අප්‍රේල්/ජූනි

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය
**Educational and News Bulletin of The National Photographic Art Soceity of Sri Lanka**


## ලැබුවා වූ සිංහල - හින්දු අලුත් අවුරුද්ද සියලු පැතුම් ඉටුවන ඉසුරුමත් නව වසරක් වේවා..



**ජාතික ඡායාරූප ශිල්ප මධ්‍යස්ථානය විවෘත වූදා**

### මාධ්‍ය රූප කලාවේ ප්‍රකම්පිත අත්දැකීම්

ජනමාධ්‍ය ඡායාරූප ශිල්පී නෝර්වේ ජාතික Morten Hvaal ගේ විශේෂ දේශනය, මැයි 03 වන ඉරුදින පෙ.ව. 9.00 ට අංක. 56/2, කඩවත පාර, කළුබෝවිල, දෙහිවල දී. පාඨමාලා හදාරන විද්‍යාර්ථීනට සහ සාමාජික ඔබට ආරාධනා.
- අධ්‍යාපන අංශය -

### 2009 උසස් ඡායාරූප පරීක්ෂණ සඳහා අයදුම් කිරීම

පරීක්ෂණ සඳහා මෙම වසරට අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ අවසන් දිනය ජූනි 30 වේ. මේ සම්බන්ධ වැඩි විස්තර ගරු විධායක අධ්‍යක්ෂතුමන් වෙතින් (071 688879) විමසිය හැකි ය.

### සංගමයේ 56 වන වාර්ෂික මහා සභා රැස්වීම - 2009/2010

සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම ජූනි මස 21 ඉරුදින පෙ.ව. 9.00 ට කොළඹ 07, ආනන්ද කුමාරස්වාමි මාවතේ මහවැලි කේන්ද්‍ර ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ. සාමාජික ඔබට ඒ සඳහා ගෞරවයෙන් ඇරයුම් කරමු.
- ගරු අධ්‍යක්ෂ මණ්ඩලය -
(මෙම පූර්ව සිහිපත් කිරීම ඔබගේ දින වකවානු වෙන්කර ගැනීම සඳහා ය. නිල ආරාධනා පත්‍රය පසුව යොමුකෙරේ. එදිනට පෙර මුදල් ගෙවා ඔබගේ සාමාජිකත්වය තහවුරු කරගෙන තිබීම අනිවාර්ය ය.)

### ඉදිරි කාලයේ ඡායාරූප පංති

අධ්‍යාපන අංශයේ මෙහෙයවීමෙන් පැවැත්වෙන ඡායාරූප පංති මාලාවේ ඉදිරි සැලසුම මතු දැක්වේ. පංති සුපුරුදු පරිදි කොළඹ 10, මහාබෝධි විද්‍යාලයේ ඉරුදින ප.ව. 1.30 සිට 4.30 තෙක් පැවැත්වේ.

මැයි : 03, 10, 17, 24, 31
ජූනි : 07, 14, 28
ජූලි : 19, 26

මාසික ඡායාරූප තරග පැවැත්වෙන දින : මැයි 31, ජූනි 28, ජූලි 26
කැලණි විහාර ප්‍රායෝගික චාරිකාව : මැයි 31 පෙ.ව. 7.00 ට
කොළඹ පැවැත්වෙන වනජීවී ඡායාරූපකරණ වැඩමුළුව : ජූලි 12

### ලංකා කැමරා නිකුත් වේ.




ලංකා කැමරා සඟරාවේ 2008 ගිම්හාන/වස්සාන ද්විත්ව කලාපය දැන් නිකුත් වී ඇත. කැමරා පාඩම, ශිල්ප කලා සහ කලා ශිල්ප, නිර්මාණාත්මක සැකැස්ම, සූක්ෂ්ම චිත්‍රපටකරණය, පෙරණ, රූප සන්නිවේදනය, ඡායාරූප ක්ෂේත්‍රයේ නව නිෂ්පාදන සහ ඩිජිටල් තාක්ෂණයේ අලුත් මුහුණු, ඇතුළු තොරතුරු රැසක් ද, දෙස් විදෙස් ඡායාරූප සංවිධාන පිළිබඳ කාලීන තොරතුරු ද මෙහි අන්තර්ගත වේ.

## රූ රස කතිකාව

**රූප මාධ්‍යයේ ප්‍රබුද්ධත්වය සොයා යන සංවාදාත්මක සංකථනය**

| | |
|---|---|
| ආරාධනය | : සාමාජික ඔබ සැම දෙනාට |
| දවස | : සැම මසක ම දෙවන ඉරු දින |
| වේලාව | : ඉරිදා පෙ.ව. 9.00 ට |
| තැන | : "අපේ ගෙදර" - සංගම් මූලස්ථානය (අංක. 56/2, කඩවත පාර, කළුබෝවිල, දෙහිවල.) |
| පළමු පියවර | : මැයි මස 10 වන ඉරුදින |
| නිමිත්ත | : අශෝක හඳගමයන්ගේ සල රූ වියමනක් |

සංගමයේ ඩිප්ලෝමා වසර විද්‍යාර්ථීන්ගේ අනිවාර්ය අධ්‍යයන අවශ්‍යතාවක් සපුරාලීම ද, සාමාජික සැම දෙනාගේ ප්‍රබුද්ධ රසවින්දනය මුවහත් කිරීම ද අරමුණු කොටගෙන "රූ රස කතිකාව" මැයි මස 10 වැනි දින සිට ආරම්භ කිරීමට විධිවිධාන යොදා ඇත. ඩිප්ලෝමා වසරේ විද්‍යාර්ථීන්ගේ සහභාගීත්වය අනිවාර්ය කෙරෙන අතර, මේ සඳහා ලැදියාව දක්වන පළමු හා දෙවන වසර විද්‍යාර්ථීන්ට ද, සෙසු සාමාජික භවතුන්ට ද මේ සඳහා ආරාධනය කෙරේ.

රූ රස කතිකාවේ පළමු පියවර සඳහා තේමා වන්නේ සිනමාවේදී අශෝක හඳගමගේ සිනමා කෘතියකි. 17 වන ඉරුදින පෙ.ව. 9.00ට අශෝක හඳගමයන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන සංවාද සැසියට ද ඔබට සහභාගී විය හැකි ය. මෙය සංගමයේ අධ්‍යාපන අංශයේ මෙහෙයවීමකි. අදාළ සැසිවාරය සංවිධානය එනම්, විශේෂ ආරාධිතයාගේ ප්‍රවාහන පහසුකම් සැපයීම, ආරාධිතයාට තිළිණයක් ප්‍රදානය සහ සහභාගී වන්නන්ට තේපැන් සංග්‍රහයක් සූදානම් කිරීමේ වගකීම ඩිප්ලෝමා වසර විද්‍යාර්ථීන්ට පැවරේ. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු රූ රස කතිකාවේ සංවිධාන වගකීම හොබවන ප්‍රදීප් වෙදමෙස්ත්‍රිගේ 071 - 5333318 මහතාගෙන් විමසිය හැකි ය.

---

### සාමාජිකත්වය ආරක්ෂා කර ගනිමු.

සංගමයේ පැවැත්ම උදෙසා වන ඔබේ ආර්ථික අතහිත දීම, 2009 වසර සඳහා වන සාමාජික මුදලයි. මෙතෙක් එය නොගෙවූයේ නම්, ගරු මුදල් අධ්‍යක්ෂ ප්‍රියන්ත අමරසිංහ මහතා හෝ මුදල් කමිටුවේ නියෝජිතයෙකු වෙත සාමාජික මුදල ලබා දී සාමාජිකත්වය තහවුරු කරගන්න. සංගමයේ සෑම කාර්යයක දී ම ඔබේ වලංගු සාමාජික හිමිකම, එනම් හැඳුනුම්පත සහ වාර්ෂික සාමාජික ගාස්තු ගෙවූ රෝස පැහැති කාඩ්පත ඔබ සතු ව තිබීම අත්‍යවශ්‍ය වේ.

### අපේ ඇත්තන්ගේ අලුත් රාජකාරී

- ජ්‍යෙෂ්ඨ සාමාජික හර්ෂ මධුරංග ජයසේකර මහතා සිය නව ව්‍යාපාරික ස්ථානය Foto Station නමින් රාජගිරියේ කෝට්ටේ පාරේ, කාර්ගිල්ස් ෆුඩ්සිටි අසල දී පසුගිය දා විවෘත කළේ ය.
- සාමාජික රේණුක ලියනාරච්චි මහතා, අනුරාධ චිත්‍රාගාරය නමින් නව ව්‍යාපාරික ස්ථානයක් කඩවත ගණේමුල්ල පාරේ විවෘත කර තිබේ.

හර්ෂගේත්, රේණුකගේත් නව ව්‍යාපාර කටයුතු සර්ව ප්‍රකාරයෙන් ම සඵල වන්නට සියලු සාමාජික භවතුන්ගේ ශුභාශිංසන පිළිගන්වමු.

---



### සුබ මංගලම්

සංගමයේ ක්‍රියාකාරී සාමාජික උපුල් ජයන්ත රණේපුර මහතා, කිරිඳිවැල තිළිණි සඳමාලි මෙණෙවිය සමග නොබෝදා අතිනත් ගත්තේ ය. නව යුවළට අපේ සුබපැතුම් ..

## The exclusive field photo activity

**Speed & Action**

සංගමයේ වෘත්තීය කණ්ඩයම විසින් මෙහෙයවන ලද Speed & Action වැඩමුළුව අප්‍රේල් මස 04 වැනි දින පන්නල මෝටර් ධාවන පථයෙහි දී පැවැත්විණි. කීර්තිමත් මෝටර් රථ ධාවන ශූරයෙකු මෙන් ම සම්මානලාභී වෘත්තීය ඡායාරූප ශිල්පියෙකු ද වන රොහාන් ෆොන්සේකා මහතා මෙහි ප්‍රධාන සම්පත්දායකයා ලෙස කටයුතු කළේ ය. ලක්දිව විවිධ පෙදෙස්වලින් පැමිණි ඡායාරූප ශිල්පීන් 60කට අධික ප්‍රමාණයක් වැඩමුළුවට සහභාගී වූ අතර, ඡායාරූප ශිල්පයේ අභියෝගාත්මක මෙන් ම විරල ගණයේ අත්දැකීමක් ඉතා සාර්ථක ලෙස අත්විඳින්නට තරම් ඔවුහු භාග්‍යවන්තයෝ වූහ.

රොහාන් ෆොන්සේකා මහතාගේ ආරාධනයෙන් මෝටර් රථ ධාවකයින් සහ යතුරුපැදි ධාවකයින් රැසක් වැඩමුළුවට සිය දායකත්වය සැපයූ අතර, මෙරට කීර්තිමත් ධාවන ශූරයෙකු වන උපාලි දසනායක මහතා සංගමය වෙනුවෙන් සිය ධාවන පථ නොමිලයේ ලබාදීමට කාරුණික විය. මෙම වැඩමුළුව සඳහා එප්සන් - ඩීබග්, ලක්ලිවි, පින්තූර.com, Catseye යන ආයතන ද ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා ද අනුග්‍රහය දැක්වීය. ඒ සැමට සංගමයේ ප්‍රණාමය හිමි වේ.

මෙදින වැඩමුළුවේ ලබාගත් ඡායාරූපවලින් තරඟයක් පවත්වා විශේෂ ත්‍යාගයක් හා සහතිකපත් ප්‍රදානය කෙරේ, සහභාගී වූ අය තම නිර්මාණ මැයි මස 10 දිනට පෙර සංගමයේ වෘත්තිය කණ්ඩායම වෙත හෝ පහත සඳහන් ස්ථාන අතුරින් එකකට ලබාදිය යුතු යැයි වැඩමුළුවෙහි ප්‍රධාන සම්බන්ධීකාරක වශයෙන් කටයුතු කළ සම්පත් පීරිස් (071 - 8202444) මහතා පවසයි. (කොළඹ ඩිජිටල් එක්ස්පෝෂර් වර්ණ රසායනාගාරය, මීගමුව සත්‍යා ස්ටුඩියෝ)

### 2007 ඩිප්ලෝමා විභාග ප්‍රතිඵල නිකුත්වේ.

2007 අධ්‍යයන වර්ෂයට අදාළව 2008 ජනවාරි මස පැවැත්වූ වාර්ෂික ඡායාරූප විභාගවල ප්‍රතිඵල මීට පෙර නිකුත් කෙරුණු අතර, ඩිප්ලෝමා නිබන්ධන සම්පාදනය ප්‍රමාද වීම හේතුවෙන් එම කොටසේ අවසන් ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාද විය. එයපසුගිය සතියේ නිකුත් කෙරුණු අතර, ලකුණු අනුපිළිවෙලින් ප්‍රථම, දෙවන, හා තෙවන ස්ථාන ලබා සාමර්ථ්‍යය ලැබූ අපේක්ෂක අපේක්ෂිකාවන් පහත සඳහන් ය.

1. ආර්. එච්. උපුල් ජයන්ත (සම්මාන)
2. කේ. ජී. ඒ. පුෂ්පකුමාර (සම්මාන)
3. ඩී. ඩී. නුවන් ගල්පාය (සම්මාන)

### 2008 ඩිප්ලෝමා නිබන්ධන භාරගැනීම

2008 අධ්‍යයන වර්ෂයට අදාළව 2009 ජනවාරි මස පැවැත්වූ වාර්ෂික ඡායාරූප පරීක්ෂණයේ ඩිප්ලෝමා වසරේ අපේක්ෂකයින්ගේ නිබන්ධන භාරගන්නා අවසන් දිනය මැයි 31 වේ. ඉන්පසු ඉදිරිපත් කෙරෙන 2009 අධ්‍යයන වර්ෂයට කල්තැබෙනු ඇත.

**පිළිසඳරට වෙහෙස මහන්සිය**

ශාන්ත ගුණරත්න
උදිත ගයාෂාන් ගුණසේකර
නිශාන්ත ප්‍රියදර්ශන
ප්‍රභාත් චතුරංග ද සිල්වා
විමල් ප්‍රියශාන්ත

## කඳුරට ඡායාරූප සංගමය හතළිස් වස සපුරයි.

වසර 1969 දී සාමාජික සාමාජිකාවන් 19 දෙනෙකුගේ සමාරම්භකත්වයෙන් දියත් වූ කඳුරට ඡායාරූප සංගමය මෙම වර්ෂයේ දී හතලිස් වස සපුරයි. දසක හතරක් පුරා මධ්‍යම පළාතේ දූ දරුවන්ට නොමිලයේ ඡායාරූප ශිල්ප ඥානය ලබාදුන් කඳුරට සංගමයට, ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ හෘදයංගම සුබපැතුම් පිරිනැමේ. එදා පටන් අද දක්වා ම එහි පුරෝගාමීත්වය දැරූ සහ ඊට නායකත්වය සැපයූ ඩී.ජී. රණතුංග සූරීන්ගේ මාහැඟි කැපවීම හා ප්‍රජා සත්කාරයට ද අපගේ ප්‍රණාමය හිමි වේ.

## දිගැසිය නෙත රැඳි රූ 2009

ලංකා ප්‍රභාලේඛිකා සංසදයේ මෙහෙයවීමෙන් සංවිධානය කෙරුණු දිගැසිය නෙත රැඳි රූ 2009 ඡායාරූප තරගය සහ ප්‍රදර්ශනය මාර්තු මස 08, 09, 10 දිනවල කොළඹ ජාතික කලාභවනේ දී පැවැත්විණි. කාන්තා කටයුතු අමාත්‍යතුමියගේ පෞද්ගලික ලේකම් ජී. සමරක්කොඩි, ආචාර්ය චන්‍ද්‍රලතා සමරසේකර, ජාත්‍යන්තර ශූරතා දිනූ මලල ක්‍රීඩිකා දමයන්ති දර්ශා, සහකාර පොලිස් අධිකාරී දීමනී පෙරියප්පෙරුම, ගුවන් කපිතාන් අනුෂා සිරිරත්න යන මහත්ම මහත්මීන්ගේ ප්‍රධානත්වයෙන් ප්‍රදර්ශනය විවෘත කෙරුණු අතර, ඡායාරූප තරගයේ කෘති තේරීම සම්මානනීය ඡායාරූප කලාවේදීන් වන එච්.එම්.ආර්. පෙරේරා, ආරිය බණ්ඩාර සමරකෝන්, යමුනි රශ්මිකා පෙරේරා යන මහත්ම මහත්මීන් අතින් සිදුවිය.

මෙම කාර්යය ඉතා සාර්ථක ලෙස ඉටුකරලීම සම්බන්ධයෙන් ලංකා ප්‍රභාලේඛිකා සංසදය වෙත ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ සුබපැතුම් පිළිගැන්වේ.

### "නිර්වාණය" - චමින්දගේ බෝපත් හැඩතල විමසුම

අප සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික චමින්ද ප්‍රියංජිත් උපසේන සිය 04 වන ඒක පුද්ගල ඡායාරූප ප්‍රදර්ශනය "නිර්වාණය" නමින් සහෘද ඔබ වෙත ඉදිරිපත් කරයි. මෙහි පළමු එළිදැක්ම අප්‍රේල් 17-18 දිනවල තිස්සමහාරාම රජමහා විහාරයේ දී පැවැත්විණි. ඉදිරියේ දී දිවයිනේ සෙසු පළාත්වල ද අගනගරයේ ද ප්‍රදර්ශනය පැවැත්වීමට චමින්ද අදහස් කරයි.

"නිර්වාණය" යනු බෝපත්වල සුවිශේෂ වර්ණ හැඩතල පාදක කොටගෙන අනිත්‍ය ප්‍රතිසංයුක්ත රූපමාලාවක් ඉදිරිපත් කිරීමට දරනු ලැබූ පර්යේෂණාත්මක වෑයමකි. චමින්දට සංගමයේ සියලු සාමාජික භවතුන්ගේ ආශිර්වාදය පිරිනමමු.

## විශේෂ දැනුම්දීමක්.

හැමදාමත් සංගමයට ආදරය කළ ඔබ, සංගමය සතු අල්ප මාත්‍රික හෝ භෞතික සම්පත් කොහොමින් හෝ රැකදෙන්නට මෙතෙක් දැරූ වෙර වීරිය කාගේත් නොමඳ පැසසුමට පාත්‍රවිය යුතුයි. ඉන්නට හිටින්නට තැනක් නැති නිසා සංගමයේ බඩුබාහිරාදිය බලෙන් ම වගේ සංගමයේ හිතවතුන්ගේ ගේදොරවල්වල ආරක්ෂා සහිතව තබන්නට අපට සිදුවුණා.

ඒත් දැන් අපිට අපේ ම කියලා තැනක් තිබෙන බව ඔබ දන්නවා. ඒ නිසා මෙතෙක් ඔබ විවිධ ගැහැට විඳිමින් අරපරිස්සම් කළ සංගමයේ භෞතික සම්පත්, අපේ මහ ගෙදරට භාරකරන්නට දැන් කාලය එළැඹී තිබෙනවා.

සංගමය සතු යම් භෞතික දේපළක් ඔබ සතු නම් අමතන්න උදිතට (071 8706680) හෝ නාරදට (0712791026) දැන් ඒවායින් නියම ප්‍රයෝජන ගන්න කාලය ඇවිත්.

## උදේනිගේ ප්‍රතිබිම්බ කලා පාඨමාලා

ජ්‍යෙෂ්ඨ සාමාජික උදේනි අල්විස් මෙහෙයවන පාඨමාලා තුනක් "අපේ ගෙදර" දී සංවිධානය කෙරෙනවා. දස දෙනෙකුගේ කණ්ඩායම් වශයෙන් මෙම පාඨමාලා ඔබට පහසු කාලසටහනක් යටතේ ඉදිරිපත් කෙරෙන බැව් ඔහු පවසනවා. අහන්න, වැඩි විස්තර උදේනිගෙන් (0777 751819)

**ව්‍යවහාරික වීඩියෝ මාධ්‍ය පිළිසඳර**
(ඡායාරූප ශිල්පය දන්නා ඇත්තන්ට වීඩියෝ මාධ්‍ය ඥානය ලබාදීමට සැලසුම් කරන ලද්දකි.)

**නිශ්චල ඡායාරූපකරණයේ මූලධර්ම**
(ඔබට නොවේ. පුංචි කැමරාවකින් අහුවෙච්චි හැටියට පොටෝ ගන්නා ඔබේ හිතවතුන්ගේ මූලික විෂය ඥානය සඳහා ඉදිරිපත් කෙරෙන්නක්.)

**ග්‍රාපීය සැලසුම්කරණ වැඩමුළුව**
(පරිගණක භාවිතයෙන් අර්ථවත්, නිර්මාණාත්මක ක්‍රියාකාරකම් තමන්ට ම කරගන්නට මගපෙන්වීමක්.)

පාඨමාලා අන්තර්ගතය සඳහා ලංකා කැමරා 2008 වසන්ත කලාපයේ 64 වන පිටුව පෙරළන්න.

## සිත්තරුන්ට ඇරයුමක්.

චිත්‍ර කලාවට ලැදි සැම වෙනුවෙන් ශාස්ත්‍රවේදී ප්‍රියන්ත අබේසුන්දර මෙහෙයවන චිත්‍ර පංතිය "අපේ ගෙදර" දී ආරම්භය මැයි 24 ඉරු දින පෙ.ව. 9.00 ට.

O/L විභාගයට චිත්‍ර ඉගෙන ගන්නා අයට
A/L චිත්‍රවලින් සමත් වීමට අදහස් කරන අයට
චිත්‍ර කලාවට පෙම් කරන කොයි කාටත්

තෙලිතුඩින් රූප මවන්නට කැමති අපේ සාමාජිකයන්ට මේ පංතිය විවෘතයි. සේරම විස්තර ප්‍රියන්තගෙන් (0777 416669) අහන්න.

## කැලුම්ගේ ප්‍රතිබිම්බ කලා පංතිය

කැලණිය විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලාවේ "ප්‍රතිබිම්බ කලා" විෂය සඳහා පංතියක් "අපේ ගෙදර" පැවැත්වෙනවා. ඡායාරූප, සිනමා, රූපවාහිනී ක්ෂේත්‍රයෙන් බාහිර උපාධි හදාරන්නන්ට අපූරු විෂයක් වගේ ම රූප මාධ්‍යයට ලැදි කොයි කාටත් විශ්වවිද්‍යාල මට්ටමේ නැණ නුවන එක්රැස් කරගැනීමේ ආරාධනයක් තමයි මේ. අපේ සාමාජික කැලුම් කුමාර මොහොට්ටිගේ (077 3985630) වෙතින් මේ ගැන විස්තර දැනගත හැකියි.

## අපේ ශෝකය

- *සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු මෙන් ම සම්මානනීය ඡායාරූප ශිල්පියෙකු ද ඡායාරූප සාහිත්‍යය පෝෂණය කළ ලේඛකයෙකු ද වූ සේන අභයපාල කොතලාවල මහතා පසුගිය දා අභාවප්‍රාප්ත විය. එතුමන්ගේ අභාවය පළිබඳව එම පවුලේ සැම දෙනා වෙත සංගමයේ බලවත් ශෝකය පළකර සිටිමු.*
- *සම්මානනීය සිනමාකරුවෙකු, ලේඛකයෙකු, දේශකයෙකු, රංග ශිල්පියෙකු මෙන් ම පෙළ රචකයෙකු ද වූ තිස්ස අබේසේකරයන් පසුගිය දා දැයෙන් සමුගත්තේ ය. ඒ සම්බන්ධව සංගමයේ සියලු දෙනාගේ ශෝකය පිරිනමමු.*
- *ලේක්හවුස් සහ ලංකාදීප ආයතනවල සේවය කළ ජ්‍යෙෂ්ඨ ජනමාධ්‍ය ඡායාරූප ශිල්පී ඩඩ්ලි වික්‍රමසිංහ මහතා පසුගිය දා අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳ සංගමයේ ශෝකය පළකරමු.*

# ජාතික ඡායාරූප ශිල්ප මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ ප්‍රධානතම අඩුපාඩුවක් ලෙස මෙතෙක් කල් දක්නට ලැබුණු සංගම් මූලස්ථානය පිළිබඳ ගැටලුවට කෙටිකාලීන විසඳුමක් සපයා ගැන්මට හැකි වූ බැව් සාමාජික භවතුන් වෙත දන්වා සිටිනුයේ බලවත් සංතෘප්තියෙනි. සංගමයේ සාමාජික භවතුන් දෙපළක් වන චින්තක තේනුවර සහ පූර්ණිමා තේනුවර යුවළගේ පවුල සතු නිවහනක්, තාවකාලික ව සංගමයේ කටයුතු පවත්වාගෙන යාමට පරිත්‍යාග කිරීම හේතුවෙන් මෙම මූලස්ථානය ආරම්භ කිරීමට හැකි විය. මෙම සුවිශේෂ අනුග්‍රහය සම්බන්ධයෙන් සියලු සාමාජික භවතුන්ගේ ප්‍රණාමය එම දෙපළ වෙත පිරිනැමේ.

පසුගිය පෙබරවාරි 01 වැනි දින පැවැත්වීමට යෙදුණු සංගමයේ අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම වෙනදාට වඩා විශේෂත්වයකින් යුක්ත විය. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෝ දේශීය විලාසිතාවෙන් සැරසී බුලත් හුරුළු පිරිනමා සෙසු සාමාජික භවතුන් පිළිගත්හ. මධ්‍යස්ථානයේ කටයුතු නිල වශයෙන් ආරම්භ කිරීම ද, සංගමයේ ආදි කර්තෘන් ප්‍රමුඛදිවංගත සෙසු සාමාජික භවතුන් සිහිපත් කිරීම ද, සංගමයේ ඉදිරි ගමනට ආශීර්වාද කිරීම ද, අරමුණු කොටගෙන සෙත්පිරිත් සජ්ඣායනාවක් පවත්වා එදින කටයුතු ආරම්භ කෙරිණි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය පූජ්‍ය එළමල්දෙණියේ සාරානන්ද හිමියන් ප්‍රමුඛ මහාසංඝරත්නය මෙම ආගමික වතාවත් මෙහෙයවූහ.

අනතුරුව පැවැත්වුණු මහා සභාවේ දී මූලස්ථානයේ ඉදිරි කටයුතු පිළිබඳ දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණි. මධ්‍යස්ථානය සඳහා තම පෞද්ගලික දේපළ පිරිනැමූ චින්තක තේනුවර මහතා සහ එම මහත්මියට විශේෂ සම්මානයක් ප්‍රදානය කළ අතර, ගෞරව සාමාජිකත්ව පිරිනැමීමට ද යෝජනා විය. මෙම ස්ථානය "ජාතික ඡායාරූප ශිල්ප මධ්‍යස්ථානය" ලෙස හැඳින්වෙන අතර, එය සාමාජික සුබසාධනය සඳහා උපරිම ලෙස මෙහෙයවන බව සභාපතිවරයා ප්‍රකාශ කළේ ය. මූලස්ථානයේ යෝජිත වැඩපිළිවෙළ සභාගත කෙරුණු අතර, ඒ සඳහා සාමාජික භවතුන්ගේ අනුග්‍රහය ද ඉල්ලා සිටිනු ලැබිණ. ඒ වන තෙක් මධ්‍යස්ථානය පිළිසකර කිරීමට සහ සැලසුම් කිරීමට දායක වූ සියලු සාමාජික භවතුන්ට අධ්‍යක්ෂ මණ්ඩලයේ ගෞරව පූර්වක ස්තුතිය ද පිරිනැමිණි.

### මූලස්ථානය පවත්වාගෙන යාමේ අරමුණු

1. සංගමයේ කළමනාකරණ කටයුතු නිසි පරිදි මෙහෙයවීම.
2. ඡායාරූප ශිල්ප අධ්‍යයන කාර්යයන් මනා ව ඉටු කරගැනීම.
3. සංගමය සතු භෞතික සම්පත් ආරක්ෂිත ව පවත්වාගැනීම.
4. සමාජ සේවා අංශයේ වැඩසටහන් සංවිධානය.
5. ප්‍රදර්ශන අංශයේ වැඩසටහන් සංවිධානය.
6. ප්‍රකාශන අංශයේ වැඩසටහන් සංවිධානය.
7. වෘත්තීය අංශයේ වැඩසටහන් සංවිධානය.
8. කාන්තා අංශයේ වැඩසටහන් සංවිධානය.
9. පාසල් අංශයේ වැඩසටහන් සංවිධානය.
10. සාමාජික සුබසාධන හා සහජීවන මධ්‍යස්ථානයක් පවත්වා ගැනීම.

### මූලස්ථාන පරිශ්‍රය තුළ අන්තර්ගත කිරීමට යෝජිත කොටස්

සංගමයේ මෙහෙයුම් කාර්යාලය.
ඡායාරූප ශිල්ප චිත්‍රාගාරය.
දේශන/රැස්වීම් ශාලාව
ප්‍රතිබිම්බ කලා පුස්තකාලය
ඡායාරූප ශිල්ප කෞතුකාගාරය
කලු සුදු රසායනාගාරය.

### ජාතික ඡායාරූප ශිල්ප මධ්‍යස්ථානයේ අනුග්‍රාහකයෝ

සංගමයේ ඉදිරි ගමන වඩාත් ජවසම්පන්න ලෙස දියත් කිරීමට නව මූලස්ථානය මහඟු පිටුවහලක් වනු ඇත. එහි වැදගත්කම ගැඹුරින් වටහාගත් සහ සංගමයට දැඩි ව ආදරය කරන සාමාජික භවත්හු මූලස්ථානයේ අවශ්‍යතා හැකි පමණින් සපුරාලීමට ඉදිරිපත් වූහ. ඒ සියලු පරිත්‍යාග අනගි ජාතික මෙහෙවරක භක්තිමත් දායකත්වයන් ලෙස සැලකිය හැකි අතර, ඒ සැම දෙනාට ම සංගමයේ ප්‍රණාමය හිමි වේ. මේ දක්වා මූලස්ථානයේ අවශ්‍යතා සඳහා විවිධ අතහිත දීම් සිදු කළ සාමාජික භවතුන්ගේ ලේඛනය පහත සඳහන් වේ.

| | |
|---|---|
| එල්.බී.එස්.එස්. බාලසූරිය මහතා | - ජාතික ධජය |
| විජය බස්නායක මහතා | - විකාශ උවකුරුව, ඡායාරූප ශිල්ප සඟරා, මුදලින් රු. 25,000/- (සංගමයේ භාණ්ඩාගාරයට) |
| ප්‍රදීප් වෙදමෙස්ත්‍රිගේ මහතා | - ඇමතුම් පුවරුව |
| කුමාර කරව්දෙණිය මහතා | - 2x4 මැගි බෝඩ් එක |
| සම්පත් පීරිස් මහතා | - වර්ණ විස්තාරකය |
| මංගල එදිරිසිංහ මහතා | - CFL විදුලි බුබුලු 10 |
| ඩී.ජී. රණතුංග මහතා | - අඳුරු කුටි උපකරණ, හකුලන යකඩ පුටු 05, මි.මී. 16 ප්‍රක්ෂේපන යන්ත්‍රය, පොත්පත්, සඟරා |
| සරත් කුමාර මහතා | - හකුලන යකඩ පුටු 02 |
| අජිත් නානායක්කාර මහතා | - චිත්‍රාගාර පසුබිම් තිරය |
| ඉඳුනාථ තේනුවර මහතා | - කැසට් රේඩියෝව |
| පෙරේරා මහතා | - Piv පරිගණක කට්ටලය |
| අමරා වීරසේකර මහත්මිය | - P iii පරිගණකය, විදුලි රැහැන්, CFL විදුලි බුබුලු |
| රංජනී අරන්දර මහත්මිය | - විදුලි රැහැන්, CFL විදුලි බුබුලු |
| චම්පා කුරුප්පු මහත්මිය | - පාපිසි 03 |
| රවීන්ද්‍ර පුෂ්පකුමාර මහතා | - ප්ලාස්ටික් කුණුබඳුන් 03 |
| ඉන්දික ප්‍රනාන්දු මහතා | - ලිපි ද්‍රව්‍ය |
| ජී.ඒ.එස්. කුමාර මහතා | - ලිපි ද්‍රව්‍ය |
| එන්.ආර්. කපුරුගේ මහතා | - ලිපි ද්‍රව්‍ය |
| කිත්සිරි ගුණවර්ධන මහතා | - විකාශ උවකුරුව |

### සමාරම්භක උත්සවයේ ආහාරපානාදිය සම්පාදනයෙන් අනුග්‍රහය දැක්වූ සාමාජික භවතුන්

ශ්‍යාමලී කරුණාපාල මහත්මිය, සේනාරත්න බණ්ඩාර මහතා, වජිර වික්‍රමගේ මහතා, වසන්ත කුමාර අමරසූරිය මහතා, රොහාන් පෙරේරා මහතා, කුමාර කරව්දෙණිය මහතා, දූෂාන් තරංග මහතා, ගයාන් අමිල මහතා, හසිත ධනන්ජය මහතා, ඉන්දික මහතා, විමලසූරිය මහතා.

### මූලස්ථානයේ නවීකරණ කටයුතු සඳහා දායක වූ සාමාජික භවතුන්

පියසෝම කෝරලේවිදාන මහතා, විජය බස්නායක මහතා, රවීන්ද්‍ර පුෂ්පකුමාර මහතා, වෛද්‍ය මංගලනාත් උඩුකල මහතා, රොෂාන් පෙරේරා මහතා, පිලිෂියන් පෙරේරා මහතා, ප්‍රියන්ත අබේසුන්දර මහතා, රංජිත් පෙරේරා මහතා, ජී.ඒ.එස්. කුමාර මහතා, දූෂාන් තරංග මහතා, ගයාන් අමිල මහතා, සිතුමිණි රත්නමලල මහතා, අශෝක ජේමසිරි මහතා, ශ්‍යාමලී කරුණාපාල මහත්මිය, අමරා වීරසේකර මහත්මිය, රංජනී අරන්දර මහත්මිය, තිනේෂා එදිරිසිංහ මෙණෙවිය, චම්පා කුරුප්පු

මෙණෙවිය, අමාලි නානායක්කාර මෙණෙවිය, විජිතා නන්දනී මෙණෙවිය, සුජාතා පතිරාජ මහත්මිය.

**මූලස්ථාන නවීකරණ කාර්යයේ බරපැන**

නව මධ්‍යස්ථානය පිළිසකර කිරීම සහ අත්‍යවශ්‍ය භාණ්ඩ මිල දී ගැනීම් සඳහා රු. 75,000/- කට අධික මුදලක් අවශ්‍ය විය. එම මුදල පසුගිය නිල වර්ෂයේ සමාජ සේවා සහ සුබසාධන අංශයේ ව්‍යාපෘතිවලින් ඉතිරි වූ මුදල්වලින් ද, වෘත්තීය කණ්ඩායමේ වැඩමුළුවලින් උපයාගත් මුදලින් ද පියවා ගැනිණි. මේ අනුව පසුගිය නිල වර්ෂයේ සමාජසේවා අංශයේ කටයුතුවලට දායක වූ සියලු සාමාජික භවතුන්ගේ ද, වෘත්තීය අංශයේ කාර්යයන් සඳහා අතහිත දුන් හා සහභාගී වූ සැම දෙනාගේ ද ශ්‍රමය හා කැපකිරීම් වැදගත් ජාතික මෙහෙවරකට පසුබිම් වූ බව ගෞරව පෙරදැරි ව සඳහන් කළ මනා ය.

**මූලස්ථානයේ අභිවෘද්ධිය පතා විවිධ පරිත්‍යාග පිණිස ඉදිරිපත් වී සිටින සාමාජික භවතුන්**

තිලක වෙරළුපිටිය මහතා, රාහුල පෙරේරා මහතා, කේ.ජ්. විජේරත්න මහතා, සරත් නුකුලසූරිය මහතා, ප්‍රසන්න විතානගේ මහතා, හසිත ලියනගේ මහතා, චන්දිම සමරනායක මහතා, රෝහිණී මුණවීර මහත්මිය.

**මූලස්ථානයේ භාරකාරත්වය**

නව මූලස්ථානය සංගමයේ පරමාර්ථ හා අනුකූල වන පරිදි මනා කළමනාකාරීත්වයකින් යුතු ව පවත්වාගැනීමේ වගකීම සංවර්ධන හා ප්‍රවර්ධන අධ්‍යක්ෂ අතුල රණරාජා මහතාට ද, සමාජ සේවා සහ සුබසාධන අධ්‍යක්ෂ නාරද අමරතුංගආරච්චි මහතාට ද පවරා ඇත. එහි නේවාසික ස්ථාන භාර නිලධාරීන් ලෙස ඉන්දික රත්නායක සහ සමන් ලෙනින් යන සාමාජික භවතුන් පත්කරනු ලැබ තිබේ.

**මධ්‍යස්ථානය සඳහා ඔබේ දායකත්වය**

සංගම් මූලස්ථානය සංගමයේ අභිවෘද්ධිය පතා පවත්වාගෙන යාමේ දී ඊට ඔබේ දායකත්වය ලබා දිය හැක්කේ පහත දැක්වෙන පරිද්දෙනි.

කලින් පිළිසඳරෙහි සඳහන් ව ඇති භෞතික සම්පත් සපයාදීම.

මධ්‍යස්ථානයේ විවිධ වැඩසටහන් සංවිධානය (විවිධ විෂය ක්ෂේත්‍රවලට අදාළ පංති, වැඩමුළු, සැසිවාර, ප්‍රදර්ශන) පිණිස බාහිර පාර්ශවයන් සම්බන්ධ කරදීම.

ඔබ විසින් මෙහෙයවන විවිධ ප්‍රජා සත්කාරක වැඩසටහන් හා වෙනත් අධ්‍යයන හා සුබසාධන කටයුතු සඳහා එම ස්ථානය යොදාගැනීම.

## 2010 වජ්‍ර ජයන්ති වැඩසටහන

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයට වසර 60 ක් සපිරීම නිමිති කොටගෙන උත්කර්ෂවත් වැඩසටහන් මාලාවක් ලබන වසරේ දී පැවැත්වීමට සැලසුම් සකස් කෙරෙමින් තිබේ. 2010 අග භාගයේ කොළඹ දී පැවැත්වෙන මෙම සංවත්සර උළෙල අරමුණු කිහිපයක් පෙරදැරි කොටගෙන සංවිධානය කෙරේ.

1. වසර 60 ක සංගමයේ යටගියාව විමර්ශනය හා ඊට අදාළ තොරතුරු එක්රැස් කිරීම.
2. සංගමයේ උන්නතිය වෙනුවෙන් කැපවූ මියගිය සාමාජික භවතුන්ට හරසර පිදීම.
3. දැනට සංගමයෙන් දුරස් ව සිටින සාමාජිකයින් යළි සංගමය සමග සම්බන්ධ කරලීම.
4. ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනයේ 60 වසර සැමරීම සහ ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනයක් පැවැත්වීම.
5. ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ලිපි සංග්‍රහ පළ කිරීම.
6. ඡායාරූප ශිල්ප සම්මන්ත්‍රණ සංවිධානය
7. ඡායාරූප ශිල්පය හා සම්බන්ධ ජාත්‍යන්තර සංවිධාන සමග සමීප සම්බන්ධතා ඇතිකරගැනීම.
8. දේශීය ඡායාරූප සංගම් සහ ක්ෂේත්‍රය සමග සම්බන්ධ ව්‍යාපාරික ආයතන සමග සුහදශීලී සම්බන්ධතා වැඩිදියුණු කරගැනීම.
9. සමරු මුද්දරයක් නිකුත් කිරීම.
10. සංගමය කෙරෙහි පොදුජන අවධානය යොමුකරවා ගැනීම.

මේ වෙනුවෙන් ක්‍රියාත්මක වීම පිණිස ක්‍රියාකාරී කමිටු 10 ක් දැනට නම් කොට තිබේ. ඒවායේ කටයුතු සාර්ථක කරගැනීම පිණිස ඔබට ද ඒවාට ඇතුළත් ව අදාළ කාර්යභාරයනට උරදිය හැකි ය. පහත සඳහන් කමිටු සම්බන්ධීකාරකවරු අමතන්න.

**කමිටුව සම්බන්ධීකාරක ඇමතුම**

1. ප්‍රදර්ශන කමිටුව-එන්.ආර්. අභයසිංහ මහතා-0777 688879
2. මුද්දර කමිටුව-ඩින්ටන් ජයසූරිය මහතා-041 5679455
3. ප්‍රකාශන කමිටුව-විජය බස්නායක මහතා-071 8229204
4. මූල්‍ය කමිටුව-ප්‍රියන්ත අමරසිංහ මහතා -011 2879816
5. ප්‍රචාරක කමිටුව-උදේනි අල්විස් මහතා-0777 751819
6. සංග්‍රහ කමිටුව-චම්පා කුරුප්පු මෙණෙවිය-077 4698122
7. සාමාජික සහයෝගිතා කමිටුව-ඒ.ඩී. ගුණරත්න මහතා -071 6390610
8. උත්සව සංවිධාන කමිටුව-තිලක වෙරළුපිටිය මහතා -077 3231676
9. ආරක්ෂක කමිටුව-චායා අබේවර්ධන මහතා-077 6114700
10. සැලසුම් කමිටුව-උ.ග. ගුණසේකර-071 8106680

i. අනුග්‍රාහකත්ව අනුකමිටුව -සුනිල් වික්‍රම මහතා -071 2726517
ii. සම්මන්ත්‍රණ අනුකමිටුව -චන්ද්‍රසේන පෙරේරා මහතා -071 4749435
iii. සැරසිලි අනුකමිටුව -කුමාර කරව්දෙණිය මහතා-071 6144223
iv. ශාලා සැලසුම් අනුකමිටුව -ප්‍රියන්ත අබේසුන්දර මහතා-0777 416663
v. බැනර් අනුකමිටුව -ජීවනී ශ්‍රියා ප්‍රියන්ති මෙණෙවිය-071 8183669
vi. වෙළඳ කුටි අනුකමිටුව -සම්පත් පීරිස් මහතා -071 8202444
vii. අධ්‍යාපනික ප්‍රදර්ශන අනුකමිටුව-වජිර වික්‍රමගේ මහතා -011 2670790
viii. සමරු භාණ්ඩ අනුකමිටුව -අශෝක බුද්ධදාස මහතා -071 4402950
ix. කාර්යමණ්ඩල කළමණාකරණ අනුකමිටුව -රාහුල පෙරේරා මහතා -0777 309432
x. පවිත්‍රතා කටයුතු අනුකමිටුව -අශෝක පේමසිරි මහතා -071 2238411

මෙයට අමතරව අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන සම්බන්ධීකරණ වගකීම ද, මෙහෙයුම් හා ඇගයුම් කටයුතු පිළිබඳ වගකීම ද, ප්‍රගති සමාලෝචන කාර්යය ද ඉටුකරනු ඇත.

# ජාත්‍යන්තර තලයේ අපේ ජයග්‍රහණ

**2008 මාර්තු සිට 2009 මාර්තු දක්වා**

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ සාමාජිකයන්ගේ ඡායාරූප අනුමත ජාත්‍යන්තර ප්‍රදර්ශන සඳහා ඉදිරිපත් කිරීමේ අභ්‍යාසතිය යටතේ පසුගිය වසරේ ජයග්‍රහණ රැසක් අප සාමාජික-යන් ලැබූ බව සතුටින් දන්වා සිටිමු. එහි විස්තරය පහත දැක්වේ.

TRASPORT 2008 - XVI Biennale Competition of International Art Photography (2008/057) - SLOVAKIA

සහභාගී වූ ශිල්පීන් ගණන 10

 චන්‍ද්‍රා පියදාසගේ කෘතියක් සඳහා රිබනයක් ලැබුණි.

 සමන්ත සේනක බණ්ඩාරගේ කෘතියක් සඳහා ජූරියේ විශේෂ සම්මානය ප්‍රදානය කරන ලදි.

පහත අයගේ කෘති ප්‍රදර්ශනය විය.

1. ප්‍රියන්ත අමරසිංහ 01
2. සුනිල් වික්‍රම 02
3. බන්දු ගුණරත්න 01
4. සංඛ සම්මාන පෙරේරා 02
5. සුනන්ද කෝදාගොඩ 01
6. නෙරංජන් වික්‍රමාරච්චි 01

12th International Trieninal Exhibition Theatre in Photographic Art (2008) - (2008/57) - SERBIA

සහභාගී වූ ශිල්පීන් ගණන 09

 හෙන්රි රාජකරුණාගේ ඡායාරූපයක් සඳහා ඩිප්ලෝමා සහතිකයක් දිනාගන්නා ලදි.

29th FIAP Black and White Biennale (2008) - SLOVAKIA

සහභාගී වූ ශිල්පීන් ගණන 10

 බන්දු ගුණරත්න, ප්‍රියන්ත අමරසිංහ, චන්‍ද්‍රසේන පෙරේරා, සුනිල් වික්‍රම, ශාන්ත ගුණරත්න යන අයගේ කෘති විශේෂ සමරු කලාපයේ ප්‍රදර්ශනය විය.

The 1st Taiwan International Salon of Photography (2008) (2008/064) - TAIWAN

සහභාගී වූ ශිල්පීන් ගණන 12

 බන්දු ගුණරත්නගේ කෘති 04 ක් ප්‍රදර්ශනය වූ අතර, 3න් එක් කෘතියක් සඳහා කුසලතා සහතිකයක් හිමි විය. තව ද පහත අයගේ කෘති ද ප්‍රදර්ශනය විය.

1. චන්‍ද්‍රසේන පෙරේරා 01
2. කේ.ජී. කීර්තිරත්න 01
3. චමින්ද උපසේන 01
4. සංඛ සම්මාන පෙරේරා 01

Orhan Holding 4th International Exhibition OF Photography (2008) - 2008/122 - TURKEY

සහභාගී වූ ශිල්පීන් ගණන 11

 ප්‍රියන්ත අමරසිංහ, චන්‍ද්‍රසේන පෙරේරා, කේ.ජී. කීර්තිරත්න යන අයගේ ඡායාරූප ප්‍රදර්ශනය විය.

International Photography - Heidenheim GERMANY

සහභාගී වූ ශිල්පීන් ගණන 05

 බන්දු ගුණරත්නගේ කෘතියක් සඳහා ඩිප්ලෝමා සහතිකයක් හිමිවිය.

 චමින්ද ප්‍රියන්ජිත් උපසේන සහ සමන්ත සේනක බණ්ඩාරගේ ඡායාරූප සමරු කලාපයේ පළවිය.

52nd Maittand International Salon of Photography (2009) - AUSTRALIA

සහභාගී වූ ශිල්පීන් ගණන 12

 ප්‍රියන්ත අමරසිංහ, චින්තක තේනුවර, චන්‍ද්‍රසේන පෙරේරා, කේ.ජී. කීර්තිරත්න යන අයගේ කෘති ප්‍රදර්ශනය විය.

20th Reflet Mondial de la Photographic (2009/01) BELGIUM

සහභාගී වූ ශිල්පීන් ගණන 19

 සංඛ සම්මාන පෙරේරාගේ කෘතියක් සඳහා ඩිප්ලෝමා සහතිකයක් දිනාගන්නා ලදි.

 චන්‍ද්‍රසේන පෙරේරාගේ කෘතියක් ප්‍රදරශනය විය.

41st Howarah Colour Salon (2009) - INDIA

සහභාගී වූ ශිල්පීන් ගණන 32

1. හෙන්රි රාජකරුණා 01
2. කේ.ජී. කීර්තිරත්න 02
3. හර්ෂ ජයසේකර 01
4. අතුල රණරාජා 01
5. චින්තක තේනුවර 01
6. යූ. සෙනෙවිරත්න 01
7. බන්දු ගුණරත්න 01

යන අයගේ ඡායාරූප ප්‍රදර්ශනය විය.

## අභිගුණ්ඨික කෙල්ල සහ තෙවන ඇස

*ඔය දෑස් දිලිසෙන*
*ඒත් වියලි ව*
*කැඩපතක් ව*
*කුමක් පවසයි ද?...*
*චූටි දුවේ...*
*මගේ තෙවන ඇස*
*සැරිසරා සොයාගත්*
*ඔය චූටි දෑස්*
*කුමක් පවසයි ද?...*
*චූටි දුවේ...*
*නොලද හිසට සෙවන*
*නොලද කුසට අහර*
*නොලද සිතට නිවන*
*ඒත් ඔය දෑස්*
*කුමක් පවසයි ද?...*
*චූටි දුවේ...*

*අභිගුණ්ඨික කෙල්ල*
*ලොකු කෙල්ලක වී*
*ඔය දෑස් එලෙස ම*
*කුමක් පවසයි ද?...*
*චූටි දුවේ...*
*රටේ මහා වුන්*
*දැන් වත් දැන ගනියි ද?.*
*ඔය චූටි දෑස්*
*මුතු ඇටය වන් රටේ*
*තැන තැන මග වැටී ඇති බව*
*චූටි දුවේ ...*
*මම කුමක් පවසම් ද?..*

**විරාජ් ලියනාරච්චි**
**3 වසර**

## ඡායා රූ කවි පිලිසඳර

**වීදුරු හිත**

දුයිෂෙන්ගේ සෙනෙහසින් වැඩුණු
පොප්ලර් තුරු දෙපළ
සිහිපත් කළා මට ....
ආදරය පිරුණු
ඔබේ දෙනයන ...

අල්තිනායිගේ දුකට හඬන
ඉමක් නැති ස්ටෙප්ස් බිම
සිහිගැන්වූවා මට ....
ඒ දෙනයන හිමි
මට නොවන බව .....

**රුවනි ප්‍රියංගා දිසානායක - 08/5295 - 2 වසර**

### සුවපත් වූ සිත

ගලන දියඇලි රැඳෙන ඇළදොල සිතට සුවපත් සුවය දේවා
හමන මදනල වසින වැහි දිය තෙමුණු ගහකොළ නෙතට සුවපත් සුවය දේවා
නටන විහඟුන් නගන ගී නද කණට මිහිරිති සුවය දේවා
වැටෙන සඳරැස් පිපෙන කඩුපුල් හමන සුවඳින් ගතට සුවපත් සුවය දේවා

**ඩී.එන්. අනෝජා පෙරේරා**
**3 වසර (5108)**